මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016 (III)

මගේ අංකය : CPC/PSC/8/3/33-1
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක : 244, කටුගස්තොට පාර, මහනුවර.
2018 ජනවාරි මස .18.. දින

මධ්‍යම පළාතේ
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභාලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ
සියළුම ආයතන ප්‍රධානින් වෙත.

කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම
සංවර්ධන නිලධාරි සේවය

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මත මා විසින් 2016.10.14 දින නිකුත් කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016 විධිවිධාන පරිදි නියමිත සේවා ව්‍යවස්ථාව හෝ පරිපාටියේ සඳහන් විධිවිධානවලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුගාමී විභාග සංඛ්‍යාවක් මඟින් සම්පූර්ණ කළ හැකිය.

02. ඒ අනුව 2012.10.17 දින සිට අනුමත මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ උපඡේද අංක 10.2 හි සඳහන් ලෙස සංවර්ධන නිලධාරින් හට කාර්යක්ෂමතා කඩඉම් විභාග වර්ෂයකට දෙවරක් බැගින් පැවත්විය යුතු බැවින් 2013 වර්ෂයේ බඳවාගත් සංවර්ධන නිලධරයන්ට ස්වකිය පත්වීම් දිනයේ සිට පහත සඳහන් පරිදි විභාග අවස්ථා හය (06) ක සහන කාලයක් හිමි වේ.

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතු කාලසීමාව | 2013 වර්ෂයේ බඳවාගත් සංවර්ධන නිලධාරින් සඳහා | |
|---|---|---|---|
| | | විභාග අවස්ථාව | අදාළ විභාගය පැවැත්වූ දිනය |
| 1 වැනි කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | පළමු | 2014.08.31 |
| | | දෙවන | 2016.07.30 |
| | | තෙවන | 2017.11.25 |
| | | සතරවන | - |
| | | පස්වන | - |
| | | සයවන | - |

03. ඒ අනුව ඉහත වගුවේ දක්වා ඇති උක්ත සහන කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්ව ඇති හෝ ඉදිරියේදි සමත්වන (සයවන අවස්ථාව දක්වා පමණක්) , සංවර්ධන නිලධරයන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 15:5:1 වගන්තිය පරිදි පරික්ෂාකර ඉදිරි කටයුතු සිදුකරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

04. තවද ඉහත 03 වන ඡේදයේ සඳහන් නිලධරයන් හට අදාළ සහනයන් මෙම චක්‍රලේඛය මඟින් ලබාදී ඇති බැවින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016 හි විධිවිධාන පරිදි නැවත ඉල්ලීම් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වමි.

මෙම කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

(මෙම කොමිෂන් සභාව විසින් නිකුත් කරන චක්‍රලේඛ, විභාග ප්‍රතිඵල සහ වෙනත් විශේෂ දැනුම්දීම් ඔබගේ පහසුව සඳහා අපගේ